# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# TEA SMALL HOLDINGS DEVELOPMENT AUTHORITY

අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2018/411(01)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

ප්‍රධාන කාර්යාලය

2018-09-18 දින.

සියළුම ප්‍රාදේශිය කළමනාකරුවන්,

සහකාර ප්‍රාදේශිය කළමනාකරුවන්,

ගිණුම් නිළධාරීන් වෙත

**<u>වගා දිරි දීමනා ගෙවීම කිරීම</u>**

වගා අධාර හිමි තේ ගොවීන්ට වගා දිරි දීමනා මුදල් ලබා දීමේදි වඩා අඩු පිරිවැයක් දරමින් පහසුවෙන් මුදල් ලබා ගැනිම පිණිස චෙක්පත් ලිවීමකින් තොරව වානිජ බැංකු හරහා අවසරපත්‍රලාභියාගේ බැංකු ගිණුමට මුදල් බැර කිරීමේ ක්‍රියාවලියක් 2008-12-01 දින සිට අධිකාරිය තුළ ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව වගාදිරි දීමනා ගෙවීම් වලට අදාල 2008-11-19 දින නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ අංක 411 හි සඳහන් කරුණු වලට වැඩිමනත්වයි.

<u>සංවර්ධන අංශය</u>

1- වගා අධාර අයදුම්පත්‍රය ලබා ගන්නා විට ගෙවීම් කටයුතු කරනු ලබන්නේ බැංකු ගිණුමක් හරහා පමණක් බවට අයදුම්කරු දැනුවත් කරමින් අයදුම්කරුගේ වගා අධාර බැර කළයුතු බැංකුව , ශාඛාව , ගිණුම් අංකය සමග ජාතික හැඳුනුම්පත් අංකය ලබා ගැනිමට කටයුතු කිරීම.

2- අයදුම්කරු සතු බැංකු ගිණුමක් නොමැති නම් බැංකුවක ගිණුමක් ආරම්භ කරන ලෙස දැනුම් දී අදාල විස්තර ලබා ගැනිමට කටයුතු කළ යුතුය. එසේම බැංකු විස්තර වෙනස් වන්නේනම් එය අධිකාරිය වෙත දැන්විය යුතු බව අවසරපත්‍ර හිමියාට දැන්විය යුතුය.

3- අයදුම්පත්‍රයේ අදාල විස්තරය නොමැති නම් අවසරපත්‍රය ලබා දීමේදි ඉහත බැංකු ගිණුමට අදාල විස්තර ලබා ගැනිමට කටයුතු කල යුතු අතරම විෂය ලිපිකරු විසින් අයදුම්කරුගේ තොරතුරු පරිගණක ගත කරන අවස්ථාවේදිම බැංකු විස්තරද පරිගණකයට ඇතුළත් කළ යුතුය.

4- ඒ ඒ ප්‍රාදේශීය කාර්යාලය මගින් නිකුත් කරන ලද එක් එක් අවසරපත්‍රයේ උක්ත තොරතුරු සම්බන්ධයෙන් එම අවසර පත්‍රය නිකුත් කළ විෂය ලිපිකරු පූර්ණ වගකීමට යටත් වේ. එබැවින් විෂය ලිපිකරු විසින් තම පරිගණක පද්ධති මුරපදය අන්සතු නොකළ යුතුය.

5- කිසියම් බැංකු ගිණුම් අංකයක් සංශෝධනය කරන්නේනම් ඒ සඳහා ගිණුම් හිමියාගේ ලිඛිත ඉල්ලීමක් තිබියයුතු අතර එය ප්‍රාදේශීය කලමනාකරු සහ ගිණුම් නිලධාරී යන දෙදෙනා විසින්ම අනුමත කර තිබිය යුතුය. එය පරිගණකයේ වෙනස් කිරීම් කල යුත්තේ අදාල වගකිව යුතු නිළධාරියා විසින් පමණි.

6- ගෙවීම් වැයපත මුද්‍රණය කිරීමෙන් පසු කිසියම් බැංකු ගිණුම් අංකයක් සංශෝධනය කරන ලෙස ගිණුම්හිමියා ලිඛිත ඉල්ලීමක් කර තිබේ නම් වහාම ඒ පිළිබඳව මුදල් අංශය දැනුවත් කර ඒ සඳහා ප්‍රාදේශීය කලමනාකරු සහ ගිණුම් නිලධාරී යන දෙදෙනාගේ අනුමැතිය මත අදාළ වැයපතෙහිද පරිගණකයෙහිද වෙනස් කිරීම් කල යුත්තේ අදාල වගකිව යුතු නිළධාරියා විසින් පමණි.

7- අයදුම්කරු වෙත අවසර පත්‍රය නිකුත් කිරීමට, ගෙවීම් සිදු කිරීමට, අනුමැතිය දෙනු ලබන මාණ්ඩලික නිලධාරියා විසින් අදාළ තොරතුරු නිවැරිදි බවට සහතික විය යුතුය.

<u>මුදල් අංශය</u>

1- අවසරපත්‍රලාභියා වෙත වගා දිරි දීමනා ගෙවීම් කිරීමට පෙර මුදල් අංශයේ විෂය ලිපිකරු විසින් පරිගණක පද්ධතියේ තොරතුරු සමග සංවර්ධන අංශය ඉදිරිපත් කරන ලද වැයපතෙහි තොරතුරු නිවැරදිදැයි පරීක්ෂා කළ යුතුය.

2- වගා දිරි දීමනා ගෙවීම් වලට අදාල පළමු ගෙවීම් වාරිකය සඳහා ලදු පතක් ලබා ගත යුතු අතර එහි ආපසු එවීමට ඇති කොටසෙහි අනිවාර්යයෙන්ම ගෙවීම්ලාභියාගේ බැංකු ගිණුමට අදාල තොරතුරු සමඟ ජාතික හැදුනුම්පත් අංකය සටහන් කරවා ගත යුතුය. එමඟින් බැංකු ගිණුමේ අංකය බැංකුව හා ශාඛාව හා අනන්‍යතාවය පිළිබඳ තහවුරුවක් ලබා ගත හැකිය.

3- ගෙවීම් වැයපත මුද්‍රණය කිරීමෙන් පසු කිසියම් බැංකු ගිණුම් අංකයක් සංශෝධනය කර තිබේනම් ඒ සඳහා ගිණුම් හිමියාගේ ලිඛිත ඉල්ලීම තිබිය යුතු අතර එය ප්‍රාදේශීය කලමනාකරු සහ ගිණුම් නිලධාරී යනදෙදෙනාගේ අනුමැතිය මත සංශෝධනය කර තිබිය යුතුය.

4- බැංකු ගිණුම් විස්තර සංශෝධනය වන සෑම අවස්ථාවකදීම අදාළ ගෙවීම් වාරිකය සඳහා ලදු පතක් ලබා ගත යුතු අතර එහි ආපසු එවීමට ඇති කොටසෙහි අනිවාර්යයෙන්ම ගෙවීම්ලාභියාගේ නව බැංකු ගිණුමට අදාල තොරතුරු සමඟ ජාතික හැදුනුම්පත් අංකය සටහන් කරවා ගත යුතුය.

5- කිසිම විටක මුදල් අංශයේ විෂය ලිපිකරු විසින් බැංකු ගිණුම් අංක සංශෝධනය නොකළ යුතුය.

6- අයදුම්කරු වෙත ගෙවීම් සිදුකිරීමට පෙර මුදල් අංශයේ මාණ්ඩලික නිලධාරියා විසින් අදාළ තොරතුරු නිවැරිදි බවට සහතික විය යුතුය.

7- වගා දිරි දීමනා ගෙවීම් වලට අදාල ගෙවීම්ලාභියාගේ බැංකු ගිණුමට අදාල තොරතුරු පිළිබඳ තහවුරුවක් නොවන ඕනැම අවස්ථාවකදි ගිණුම් නිලධාරි හට දෙවන හා ඉදිරියට ඇති වාරික ගෙවීම් වෙනුවෙන් ලදුපත් කැඳවීම සිදු කළ හැකිය.

මෙම චක්‍රලේඛය 2018-09-17 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින් සියළුම විෂය ලිපිකරුවන් තම පරිගණක පද්ධති මුරපදය ආරක්ෂාකාරීව භාවිතා කළ යුතුය. වගා අධාර හිමි තේ ගොවීන්ට අවසරපත්‍ර නිකුත් කිරීමේදිද වගා දිරි දීමනා මුදල් ලබා දීමේදිද මෙම චක්‍රලේඛය පරිදි කළමනාකරණ සහකාරවරුන් වගකිමටද සහකාර ප්‍රාදේශිය කළමනාකරුවන්, ගිණුම් නිලධාරින්, ප්‍රාදේශිය කළමනාකරුවන්, වගවීමට බැදේ.

17/12/18

ඩී.පී.මහිපාල

සමානාධිකාරි

පිටපත් :-

| | |
|---|---|
| නියෝජ්‍ය සමානාධිකාරි (සංවර්ධන) | - දැන ගැනිම පිණිස |
| නියෝජ්‍ය සමානාධිකාරි (ව්‍යාප්ති) | - දැන ගැනිම පිණිස |
| අභ්‍යන්තර විගණක | - දැන ගැනිම පිණිස |
| කළමනාකරු (මුදල්) | - අවශ්‍ය කටයුතු සදහා |
| කළමණාකරු (සංවර්ධන) | - අවශ්‍ය කටයුතු සදහා |
| කළමණාකරු (මානව සම්පත් පාලන) | - සියළුම දෙනා දැනුවත් කිරිම සදහා |
| පරිගණක පද්ධති නිලධාරි | - වගා අධාර අයදුම්පත්‍රයේ තොරතුරු පරිගනක ගත කරන ලද අවස්ථාවේදිම අයදුම්කරුගේ සහනාධාර මුදල් බැර කරන බැංකුව , ශාඛාව , ගිණුම් අංකයද පරිගණකයට ඇතුලත් කිරිමට පද්ධතිය සැකසිම සදහා.<br><br>එසේම වගකිව යුතු නිළධාරියා හැර වෙනත් කිසිදු නිළධාරියකු විසින් එම වෙනස් කිරිම් සිදුකළ නොහැකි ලෙෂ පරිගණක පද්ධතිය ආරක්ෂාකාරීව සකස් කිරිම සදහා.<br><br>සියළුම විෂය ලිපිකරුවන් වෙත වෙන්වෙන්ව පරිගණක පද්ධති මුරපද ලබාදිම සදහා. |